දියවර සිරිසර

9

ශ්‍රවණය හෙවත් සවන් දීම සන්නිවේදන මාර්ගයකි. ශ්‍රවණයෙන් කරුණු උකහා ගැනීම මෙන් ම ධාරණය කර ගැනීම අසීරු කර්තව්‍යයකි. ඒ සඳහා අවධානයෙන් සවන් දිය යුතු ය. අවධානයෙන් සවන් දී කරුණු ග්‍රහණය කර ගැනීමේ කුසලතාව ජීවිතයට අවශ්‍ය වේ. ගුවන්විදුලි වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන් ආදි විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම එම කුසලතාව වර්ධනය කර ගැනීමට හොඳ අභ්‍යාසයකි. කාලීන වටිනාකමකින් යුක්ත හෝ ඓතිහාසික, සංස්කෘතික, විද්‍යාත්මක තොරතුරු ඇතුළත් විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී ඔබේ දැනුම වර්ධනය කර ගත හැකි ය. එමෙන් ම පුළුල් ජීවිතාවබෝධයක් ද ලැබිය හැකි ය. මේ පාඩමට ඇතුළත් වන්නේ ජල සම්පත පිළිබඳව සැකසුණු ගුවන්විදුලි වැඩසටහනකි. ජල සම්පත පිළිබඳ වැදගත් කරුණු රැසක් හඳුනා ගන්නා අතර ම ජල සම්පත රැක ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමට ද එය ඔබට මග පෙන්වයි.

නිවේදක:	ආයුබෝවන්! ආදරණීය ශ්‍රාවක හිතවතුනි, අද මාර්තු 22, ලෝක ජල දිනය. අද පරිසර සිරිසර ගුවන් කාලය, දියවර සිරිසර වෙනුවෙන් වෙන් වෙනවා. ඒ සඳහා අප සමග එක් වන්නේ පරිසරවේදී කුමාර ලියනගම මහතා සහ පරිසර නිලධාරි ජගත් කුමාර මහතා යි. ආයුබෝවන්, ඔබ දෙපළට!
අරාධිතයන්:	ආයුබෝවන්!
නිවේදක:	ජීවයේ පැවැත්ම රඳා පවතින්නේ ජලය මත. මිනිසුන්ට ආහාර නැතිව මසකට වැඩි කාලයක් ජීවත් වෙන්න පුළුවන් වුණාට ජලය නැතිව ජීවත් වෙන්න පුළුවන් දින තුනක් පමණ කෙටි කාලයක්. ජගත් මහත්මාණනි, ජල සම්පත ගැන වැඩි විස්තර දැන ගන්න අප කැමති යි.
ජගත් මහතා:	අභ්‍යවකාශයේ සිට බලන විට සෞරග්‍රහ මණ්ඩලයේ ඉතාමත් අලංකාර ග්‍රහලෝකය වශයෙන් පෙනෙන්නේ නිල් ග්‍රහලෝකය වන පෘථිවිය යි. පෘථිවි ග්‍රහලෝකයට මේ අලංකාරය ලැබී ඇත්තේ එහි පෘෂ්ඨයෙන් වැඩි කොටසක් ජලයෙන් වැසී ඇති නිසයි. පෘථිවියෙහි ජීවයේ සම්භවයට හේතු වූ ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ ජලය යි. අප වටා ඇති සාගරවල අතිවිශාල ප්‍රමාණයක් ජලය ඇති නිසා ද ප්‍රධාන විල් හා ගංගාවල අපට පෙනෙන ආකාරයට ක්ෂය නො වන අතිමහත් ජලස්කන්ධයක් ඇති නිසා ද, මනුෂ්‍ය වර්ගයාට කිසි දිනෙක ජල හිඟයක් ඇති නො වේ යැයි බොහෝ විට උපකල්පනය කෙරෙනවා. එහෙම වුණත් ඉදිරි දශක කිහිපය තුළ දී පිරිසිදු ජලය දුර්ලභ දෙයක් වන බවට සාක්ෂ්‍ය ඉදිරිපත් වෙමින් තියෙනවා, අද වන විට මුළු ලෝකය ම පිළිගන්නවා ජලය යනු නිරායාසයෙන් ලැබෙන අසීමිත සම්පතක් නො ව ආයාසයෙන් ලැබෙන සීමිත සම්පතක් බව.

නිවේදක:	ජීවයේ පැවැත්මට ජලයේ අවශ්‍යතාව තව දුරටත් පැහැදිලි කළොත්,
ජගත් මහතා:	සියලු ම ජීව පද්ධතිවල පැවැත්ම සඳහා ජලය අත්‍යවශ්‍ය යි. මිනිස් සිරුර තුළ සියයට 60ක් 80ක් දක්වා වූ ජලය ප්‍රමාණයක් තියෙනවා. අනෙක් භෞමික පෘෂ්ඨවංශීන් තුළ සියයට 65ක් පමණ ද මත්ස්‍යයන් තුළ 80ක් පමණ ද ඇල්ගී හා වෙනත් ජලජ ශාක තුළ 90ක් 95ක් දක්වා ද භෞමික ශාක තුළ සියයට 50ක් 75ක් දක්වා ප්‍රමාණයක් ද ජලය තියෙනවා. සජීව පද්ධතිවලට ජලය අත්‍යවශ්‍ය බව මේ සංඛ්‍යාවලින් පැහැදිලි වෙන්න ඕනෑ.

නිවේදක: ජලයෙහි වටිනාකම පිළිබඳ අතීත ජනයා වටහා ගෙන සිටි ආකාරය පැහැදිලි කිරීම මේ සාකච්ඡාව අර්ථවත් වගේ ම රසවත් වෙන්න හේතුවක් වේවි. එහෙම නේද, ලියනගම මහත්මාණනි?

ලියනගම මහතා: ඔව්, ආදි මිනිසා ජලය දේවත්වයෙහිලා සැලකුවා. ඒක නො දැනුවත්කමින් කළ දෙයක් ය සිතීම හොඳ නෑ. දේවත්වයෙහි ලා සැලකීම නිසා ජලය ආරක්ෂා වුණා.

බුදුන් වහන්සේ දේශනා කරලා තියෙනවා ජලයට අපද්‍රව්‍ය දැමීම ආපත්ති කාරණයක් බව. ඒ වගේ ම පෙර බමුණන් විශ්වාස කළා උදක පාරිශුද්ධිය නිසා බ්‍රහ්ම සහව්‍යතාවට පත් වෙනවා ය කියලා.

නිවේදක: ජලය හා බැඳුණු සංස්කෘතික වටිනාකම් රාශියක් තියෙනවා. ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කළොත්.

ලියනගම මහතා: මිනිසා හා සම්බන්ධ වැදගත් ම අවස්ථාවල ජලයට සුවිශේෂ අගයක් හිමි වුණා, උදාහරණ වශයෙන් රාජාභිෂේකයේ දී වගේ ම විවාහයේ දී අත පැන් වත්කිරීමෙන් තමයි ඒ කටයුතු සහතික වුණේ. ඒ වගේ ම බෞද්ධයන් මරණයේ දී පැන් වඩලා තමයි පින් පමුණුවන්නේ. සුබ ගමනක දී පිරුණු දිය කළයක් හමු වීම සුබ පෙර නිමිත්තක් බව අදටත් ජනයා විශ්වාස කරනවා, සැළලිහිණි සන්දේශ කවියා ඒ බව අපූරුවට වර්ණනා කළේ මෙහෙමයි.

නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩී
පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬී
සල සුදු සෙමර සේසත් ගිජිඳුනොද වැඩී
බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩී

මෙහි දිය පිරුණු කළය හඳුන්වන්න තමයි ‘පිරි කුඹු’ යන පදය යෙදුවේ. සිංහල හා දමිළ අලුත් අවුරුද්දේ පවා ජනයා ගනුදෙනු කළේ ළිඳත් එක්කයි. ඒ වගේ ම නැකතට මුලින් ම ගෙට ගත්තෙත් ගින්දර හා ජලය යි.

නිවේදක: ජලය කොතෙක් තිබුණත් ප්‍රයෝජනයට ගත හැක්කේ ඉන් ඉතා ස්වල්පයක් පමණ යි. ඒ පිළිබඳ පැහැදිලි කරන්න මං ආරාධනා කරනවා පරිසර නිලධාරී ජගත් මහත්මාට.

ජගත් මහතා: මුළු ජල ප්‍රමාණයෙන් සියයට 97ක් කරදිය. සියයට 3ක් පමණයි මිරිදිය. එයිනුත් වැඩි කොටසක් ධ්‍රැවීය අයිස් තට්ටුවල සහ ග්ලැසියරවල බැඳී ඇති නිසා ප්‍රයෝජනයට ගන්න බැහැ. මිනිසාට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැක්කේ විල්, ගංගා, ඇළ, දොළ ආදියේ ඇති මිරිදිය සහ පොළොවේ මතු පිට ආසන්නයේ ඇති මිරිදිය යි. එය පෘථිවියේ මුළු ජල ප්‍රමාණයෙන් 0.03ක් පමණ වූ සුළු කොටසක්. ඒ ජලය ද පෘථිවියේ වාසයට සුදුසු ස්ථානවල සමාන ලෙස පැතිරිලා නැහැ. ඒ නිසා තමයි ජලය උග්‍ර අර්බුදයක් බවට පත් වන්නේ. අද වන විට ලෝක ජනගහනයෙන් බිලියන දෙකක් පමණ පානීය ජල අර්බුදය නිසා පීඩාවට පත් වෙනවා, ලෝකය කෙතරම් දියුණු වුවත් වර්ෂයකට ලෝකය පුරා පන්දහසක් පමණ, අපිරිසිදු

ජලය නිසා හට ගන්නා කොලරාව, අතීසාරය, පාචනය වැනි රෝග නිසා මිය යනවා. ඛේදනීය තත්ත්වය තමයි ඉන් වැඩි පිරිසක් කුඩා ළමයින් වීම.

නිවේදක: ජලයේ ප්‍රයෝජන පිළිබඳ ලියනගම මහතාගෙන් අපි විමසමු.

ලියනගම මහතා: පෞද්ගලික කටයුතු සඳහා ජලය අවශ්‍ය වෙනවා, එනම් පානය, පවිත්‍රතා කටයුතු, සනීපාරක්ෂක කටයුතු ආදි වශයෙන්, ඒ වාගේ ම කෘෂිකර්මය හා කර්මාන්ත සඳහා ජලය අත්‍යවශ්‍ය යි. බලශක්තිය උත්පාදනයට අද ජලය භාවිත කෙරෙනවා, අතීතයේ සිට ප්‍රවාහන කටයුතුවලට ජලය ප්‍රධාන මාධ්‍යයක් වුණා.

සාමාන්‍ය වැඩිහිටි පුද්ගලයකු දිනකට ජලය ලීටර් 2ක් පමණ පානය කරනවා. ශ්‍රී ලංකාවේ පුද්ගලයකු විසින් දිනකට ප්‍රයෝජනයට ගනු ලබන ජල ප්‍රමාණය ලීටර් 135ක් පමණ. එයින් ලීටර් 9ක් බීමට හා ආහාර පිසීමටත් ලීටර් 13ක් සේදීම් කාර්යය සඳහාත් 68ක් ස්නානය සඳහාත් 45ක් වැසිකිළි කාර්යය සඳහාත් භාවිත කෙරෙනවා. සංවර්ධිත සමාජවල මේ අවශ්‍යතා මීට බෙහෙවින් වෙනස් අගයක් ගන්නවා.

නිවේදක: අපේ රටේ ඉතිහාසයේ පටන් ම හොඳ ජල කළමනාකරණ ක්‍රමවේදයක් තිබුණා නේද ජගත් මහත්තයා?

ජගත් මහතා: ඇත්තට ම ජල කළමනාකරණය සම්බන්ධව මුළු ලොවට ම ආදර්ශ සැපයුවේ මෙරට අතීත පරපුර බව අභිමානයෙන් සිහි කරන්න ඕනෑ, අපේ වාරි ශිෂ්ටාචාරයේ ඊට නිදසුන් ඇති තරම් තියෙනවා, 'අහසින් වැටෙන එක ම දිය බිඳක්වත් මුහුදට ගලා යා නො දී ප්‍රයෝජනයට ගත යුතු ය' යන මහා පරාක්‍රමබාහු රජතුමා කළ ප්‍රකාශය, ජල සම්පත පිළිබඳ ඉතා ම දැනුවත්භාවයකින් හා දුර දක්නා නුවණින් කළ ප්‍රකාශයක්.

නිවේදක: වැව, ජල කළමනාකරණය සම්බන්ධව වැදගත් වෙන්නේ කොහොම ද ලියනගම මහත්මයා?

ලියනගම මහතා: ඇත්තට ම වැව ජල කළමනාකරණයේ සදාතනික සංකේතයක්. මෙරට බොහෝ වැව්වල ආරක්ෂා වී තියෙන්නේ වැසි ජලය. කෙතරම් වියළි දේශගුණයක් යටතේ වුණත් වැවක ජලය සිඳී ගියේ නැති තරම්. වාෂ්පීකරණය අවම කරන්න නෙලුම්, මානෙල් වගේ ජලජ ශාක පැතිරෙන්න ඉඩ හැරියා, මේවායේ පත්‍ර ජලය මත ඇතිරිල්ලක් වගේ පැතිරුණා, ජලයේ සිසිල් බවත් රැකුණා. මේ නිසා ජලජ ජීවීන්ටත් යහපත් පරිසරයක් නිර්මාණය වුණා. වැව ඉහත්තාවේ ගස් ගොම්මනත් වැව දිගට පැතිරුණු කට්ටකඩුවත් නිසා ජලය වඩාත් සුරක්ෂිත වුණා. වැවක් ආශ්‍රිතව පන්සලක් ඉදි කළෙත් වැවේ අයිතිය පන්සලට පැවරුවෙත් ජලය ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් විය යුතු යි.

ජගත් මහතා: ඔව්, ඔව්, ඇළ මාර්ග පවා දඟරාකාරයෙන් නිර්මාණය කළේ ජලය වැඩි වේලාවක් රඳවා ගන්න යි. යෝධ ඇළ උදාහරණයට ගත්තොත් එහි බෑස්ම සැතපුමකට අඟල යි. සෙමින් ගලා යන නිසා උපරිම ඵලදායිතාවකින් ජලය භාවිත කරන්න අවස්ථාව ලැබුණා. ඇළ මාර්ග දෙපස කුඹුක් ගස් වැව්වෙත් ගලා යන ජලයේ වාෂ්පීකරණය අවම කිරීමත් ඇළ කණ්ඩි සේදී යෑම වැළැක්වීමත් අරමුණු කරගෙන යි. කුඹුක් ගසේ මූල පද්ධතිය ඇළ කණ්ඩියට හොඳ ශක්තියක් වුණා, මේ නිසා වර්ෂාව අධික කාලයේ දී වත් ඇළ කණ්ඩි සේදී ගියේ නැහැ. එමෙන් ම පාංශු බාදනය අවම වුණා. ඒ නිසා ජලාශවල රඳවා ගත හැකි ධාරිතාවත් වැඩි යි.

නිවේදක: මේ වන විට ජල කළමනාකරණය හා සම්බන්ධව ක්‍රියාත්මක මට්ටමේ පවතින ව්‍යපෘති හා වැඩසටහන් මොනවා ද?

ජගත් මහතා: රාජ්‍ය හා රාජ්‍ය නො වන ආයතන මගින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා, ඒ අතර ප්‍රමුඛ හා සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතිය හඳුන්වන්න පුළුවනි. වැසි ජල කළමනාකරණ ටැංකි හඳුන්වා දීම, බින්දු ජල සම්පාදය හා විසිරි ජල සම්පාදනය, අඩු ජල අවශ්‍යතා සහිත බෝග ජනප්‍රිය කරවීම, භූතල ජල ගබඩා ඇති කිරීම හෙවත් කුඩා වැව්, පොකුණු ආදිය නිර්මාණය කිරීම, විධිමත් හා අවිධිමත් ලෙස ප්‍රජාව දැනුවත් කිරීම, පුරාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීම ආදිය විශේෂ වෙනවා.

නිවේදක: පරිසර සිරිසර ගුවන් කාලය නිමා කරන්නට පෙර, ජල සම්පත රැක ගැනීම උදෙසා ජනතාවට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කිරීම වැදගත් නේ ද?

නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

ජගත් මහතා: ජල සම්පත විනාශ වීමට ප්‍රධාන ම හා එක ම වගකිව යුත්තා මිනිසා යි. ඒ නිසා පෞද්ගලික හා පොදු වශයෙන් කටයුතු කරද්දී ජලයේ වටිනාකම සිහි තබා ගෙන කටයුතු කළ යුතු යි. ගැමියන් හාල් පානු වතුර පවා වළං සේදීම වගේ පවිත්‍රතා කටයුතුවලට යොදා ගත්තා, එහෙම නැත්නම් පොල් අතු පොඟවන්න භාවිත කළා, මාළු සෝදපු ජලය පවා නිවිති වැලකට වත් කරලා ජලයෙන් උපරිම ප්‍රයෝජන ලබන්න පුරුදු වෙලා සිටියා. වන විනාශය අවම කරන්න හැකියාව ඇත්තේ මිනිසාට ම යි. විශේෂයෙන් ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීමට හැඟීමෙන් යුතුව කටයුතු කිරීම වැදගත්. ඉදි කිරීම් වගේ ම වගා කටයුතු සඳහා ඉඩම් යොදා ගැනීමේ දී ජල මූලාශ්‍රවලට හානි නො වන ලෙස සිදු කිරීම අනිවාර්ය දෙයක්. නළ ජලය භාවිත කරන්නන් නඩත්තු කටයුතු සුපරීක්ෂණයෙන් යුතුව සිදු කිරීම ද ඉතා ම වැදගත්.

නිවේදක: පාටක් නැතත් සුවඳක් නැතත් රසයක් නැතත් ජලය තරම් වටිනා දෙයක් තිබේ ද? සිතන්න. අද දින ජලය සම්බන්ධව විද්‍යාත්මක හා සංස්කෘතිමය වශයෙනුත් කරුණු ඉදිරිපත් කරමින් අපේ ගුවන් කාලය සාරවත් කළ පරිසරවේදී කුමාර ලියනගම මහතාටත් පරිසර නිලධාරී ජගත් කුමාර මහතාටත් ස්තුතිය පුද කරමින් ඔබෙන් සමු ගන්නවා. ලබන සතියේ තවත් කාලීන මාතෘකාවක් සමගින් හමු වෙමු.

අරුත් පැහැදිලි කිරීම

ආපත්ති	- පැමිණීම, ආපදාව, විපත, වරදට පැමිණීම
උදක පාරිශුද්ධිය	- ජලයෙන් ඇති වන පිරිසුදු බව
කට්ටකඩුව	- කුඹුරු යායක වැවට ඇතින් පිහිටි කොටස
ගස් ගොම්මන	- අතුපතරින් වැසී ගිය තුරු ගොමු බහුල කැලෑව
බ්‍රහ්ම සහව්‍යතාව	- බ්‍රහ්මයා සමග එක් වීම
භූතල ජල ගබඩා	- පොළොව මතු පිට ඇති විල්, පොකුණු ආදි ජලය සහිත තැන්

අවබෝධය

1. පෘථිවියේ ඇති ජලය මිරිදිය හා කරදිය වශයෙන් සංඛ්‍යාත්මකව දක්වන්න.
2. වැව යනු ජල කළමනාකරණයේ ප්‍රබල සංකේතයකි. මේ ප්‍රකාශය තහවුරු කිරීමට අදාළ කරුණු පාඩම ඇසුරෙන් දක්වන්න.
3. ජලයේ සංස්කෘතිකමය වටිනාකම සාධනය කිරීමට සාකච්ඡාවේ දී ඉදිරිපත් වූ කරුණු මොනවා ද?
4. ජල කළමනාකරණය උදෙසා අද වන විට ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති මොනවා ද?
5. ඇළ මාර්ග දෙපස කුඹුක් ගස් වැවීමෙන් සැලසුණු වාසිය කුමක් ද?

ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙනුයේ පාඩමෙන් උපුටාගත් සංවාද කොටසකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   අභ්‍යවකාශයේ සිට බලන විට සෞරග්‍රහ මණ්ඩලයේ ඉතාමත් අලංකාර ග්‍රහලෝකය වශයෙන් පෙනෙන්නේ නිල් ග්‍රහ ලෝකය වන පෘථිවිය යි. පෘථිවි ග්‍රහලෝකයට මෙම අලංකාරය ලැබී ඇත්තේ එහි පෘෂ්ඨයෙන් වැඩි කොටසක් ජලයෙන් වැසී ඇති නිසයි. පෘථිවියෙහි ජීවයේ සම්භවයට හේතු වූ ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ ජලය යි. අප වටා ඇති සාගරවල අතිවිශාල ප්‍රමාණයක් ජලය ඇති නිසා ද ප්‍රධාන විල් හා ගංගා තුළ ද අපට පෙනෙන ලෙසට ක්ෂය නො වන අතිමහත් ජලස්කන්ධයක් ඇති නිසා ද මනුෂ්‍ය වර්ගයාට කිසි දිනෙක ජල හිඟයක් ඇති නො වේ යැයි බොහෝ විට උපකල්පනය කෙරෙනවා. එහෙම වුණත් ඉදිරි දශක කිහිපය තුළ දී පිරිසිදු ජලය දුර්ලභ දෙයක් වන බවට සාක්ෂ්‍ය ඉදිරිපත් වෙමින් තියෙනවා. අද වන විට මුළු ලෝකය ම පිළිගන්නවා ජලය යනු නිරායාසයෙන් ලැබෙන අසීමිත සම්පතක් නො ව ආයාසයෙන් ලැබෙන සීමිත සම්පතක් බව.

   i. මේ ඡේදය ව්‍යාකරණානුකූලව ලිඛිත භාෂාවෙන් දක්වන්න.
   ii. ඡේදයේ ඇතුළත් උපසර්ග හා නිපාත පද වෙන් වෙන්ව දක්වන්න.

ප්‍රායෝගික අභ්‍යාස

1. මෙහි ඇතුළත් තොරතුරු ඇසුරු කර ගනිමින් ජල කළමනාකරණය යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.
2. සමස්ත සාකච්ඡාව පිළිබඳ වචන 50ක් පමණ වන සේ සාරාංශයක් සකසන්න.
3. මේ සාකච්ඡාව පන්තිය ඉදිරියේ අනුකරණාත්මකව දක්වන්න.